"විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 2698409; ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

සාමාන්‍ය දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone — 2682868, 2682869, 2682870

මගේ අංකය / எனது இல. / My No.: CSO/FIN/2/3/10(ii)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2014.08.19

## <u>මූල්‍ය චක්‍රලේඛ 12/2014</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරිවල සභාපතිවරු (බ.ප.).
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

### <u>සහනදායී මෝටර්රථ බලපත්‍ර නිකුත් කිරීම.</u>

සහනදායී මෝටර්රථ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද 2013.08.02 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2013 බස්නාහිර පළාතට අදාල කර ගනිමින් නිකුත් කරන ලද 2013.08.28 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 11/2013 හා බැඳේ.

02. ඉහත 01/2013 චක්‍රලේඛයේ 02.01(ඊ) සහ (උ) හි සඳහන් විධිවිධානයන්ට අනුව, සහනදායී මෝටර්රථ බලපත්‍රයක් වලංගු වනුයේ නිකුත් කල දින සිට වසරක කාලයක් දක්වා පමණි. පිළිගත හැකි හේතුවක් මත එවැනි බලපත්‍රයක වලංගු කාලය මාස 06කින් දීර්ඝ කර ගත හැකි වේ. නිකුත් කල දින සිට වසරක කාලය ඉකුත්වීමට පෙර බලපත්‍රයේ වලංගු කාලය දීර්ඝ කර ගත යුතු අතර වසරක කාලයට පෙර දීර්ඝ කර නොගතහොත් එය අවලංගු බලපත්‍රයක් බවට පත් වේ.

03. නිකුත් කරන ලද බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කර ගැනීම හෝ අවලංගුවූ බලපත්‍රයක් වෙනුවෙන් නව බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේදී පහත පරිදි කටයුතු කල යුතු වේ.

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණන / Director Internal Audit |
|---|---|---|---|---|---|---|
| | Tel: 2693964<br>Fax:2669479<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 2690058<br>Fax:2693952<br>dcspt@cs.wpc.gov.lk | Tel: 2693978<br>Fax:2679958<br>cdfinance@wpc.gov.lk | Tel: 2693970<br>Fax:2676280<br>dcplanc@wpc.gov.lk | Tel: 2693968<br>Fax:2689899<br>dceng@wpc.gov.lk | Tel: 2689011<br>Fax:2689011 |

**(අ). ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කිරීම හෝ අවලංගු වූ බලපත්‍රයක් වෙනුවෙන් නව බලපත්‍රයක් ලබා ගැනීම.**

1. **බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කිරීම.**

ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති බලපත්‍රයක වලංගු කාලය වර්ෂයක් වේ. එය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය නම් අවම වශයෙන් වලංගු කාලය අවසන් වීමට සති දෙකකටවත් පෙර ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර දීර්ඝ කර ගත යුතුය. නිකුත් කර වර්ෂයක් ඉක්මවූ පසු බලපත්‍රය අවලංගු බලපත්‍රයක් බවට පත් වන හෙයින් එවැනි බලපත්‍ර කිසිසේත් දීර්ඝ කිරීමක් කරනු නොලැබේ. වලංගු කාලය දීර්ඝ කර ගැනීම සඳහා අදාල අමාත්‍යාංශ ලේකම් මඟින් පහත ලියවිලි ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුවේ.

1.1 අදාල නිලධාරියා විසින් කාලය දීර්ඝ කිරීම සඳහා ප්‍රධාන ලේකම් වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීම.

1.2 මෙතෙක් ණයවර ලිපි විවෘත කර නොමැති නම් නිලධාරියා වෙත නිකුත් කල බලපත්‍රයෙහි මුල් පිටපත සහ බැංකු පිටපත.

1.3 ණයවර ලිපි විවෘත කර තිබේනම්, නිලධාරියා වෙත නිකුත් කල බලපත්‍රයෙහි මුල් පිටපත සහ ණයවර ලිපිය විවෘත කල බවට බැංකුවෙන් ලබා ගත් තහවුරු කිරීමේ ලිපිය.

1.4 අදාල නිලධාරියාගේ ඉල්ලීම හා ඊට අදාල කරුණු තහවුරු කරමින් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය.

2. **වලංගු කාලය දීර්ඝ කර නොගෙන අවලංගුවූ බලපත්‍රයක් සඳහා නව බලපත්‍රයක් ඉල්ලුම් කිරීම.**

නිකුත් කල දින සිට වසරක් ඉක්මවීමට පෙර බලපත්‍රයේ වලංගු කාලය දීර්ඝ කර නොගත හොත් එය අවලංගු බලපත්‍රයක් බවට පත් වේ. අවලංගුවූ බලපත්‍රයක් තවදුරටත් දීර්ඝ කිරීමක් කරනු නොලැබේ. ඒ සඳහා අවශ්‍ය නම් එම අවලංගු වූ බලපත්‍රය ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඒ සඳහා නව බලපත්‍රයක් ලබා ගත හැකිවේ. එහිදී නව බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේදී අනුගමනය කල යුතු සියලු ක්‍රියා පටිපාටීන් අනුගමනය කල යුතු වේ. ඒ අනුව මේ සම්බන්ධව පහත පරිදි කටයුතු කල යුතු වේ.

2.1 අදාල නිලධාරියා විසින්, තමාගේ බලපත්‍රය අවලංගු වී ඇති බැවින් දැනට අවලංගු වී ඇති මුල් බලපත්‍රය සහ බැංකු පිටපතද ඉදිරිපත් කරමින් ඒ සඳහා නව බලපත්‍රයක් නිකුත් කරන ලෙස ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීමක් කල යුතුය.

2.2 නව බලපත්‍රය ලබා ගැනීම සඳහා 2013.08.28 දිනැති මුල්‍ය චක්‍රලේඛ 11/2013 මඟින් හඳුන්වා දී ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කල යුතු වේ. මෙහිදී බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කල යුතු සියලු ලියවිලි නැවත වරක් ඉදිරිපත් කල යුතු අතර අවලංගු වූ බලපත්‍රය නිකුත් කිරීමේදී ඉදිරිපත් කර තිබූ ලියවිලි මෙහිදී සැලකිල්ලට ගනු නොලැබේ.

2.3 ඉහත සියලු ලියවිලි ලේකම්වරයාගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කල යුතුය.

2.4 නව බලපත්‍රය නිකුත් කිරීමේදී අවලංගුවූ බලපත්‍රයේ මුල් පිටපත හා බැංකු පිටපත ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් රඳවා තබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීම හෝ අවලංගුවූ බලපත්‍රය වෙනුවට නව බලපත්‍රයක් ලබා ගැනීම.**

01. පළාත් සභාව වෙත බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය පැවරීමට පෙර බලපත්‍ර නිකුත් කරනු ලැබුවේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසිනි. එසේ නිකුත් කරන ලද බලපත්‍රයේ වලංගු කාලය දීර්ඝ කිරීමට අවශ්‍යනම් එය වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර දීර්ඝ කරවා ගත යුතුව ඇත.

02. එසේම එම බලපත්‍රය අවලංගු වී තිබේ නම් එහිදීද මුල් බලපත්‍රය හා බැංකු පිටපත වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර එය අවලංගු වූ බලපත්‍රයක් බවට එම දෙපාර්තමේන්තුවෙන් ලිපියක් ලබා ගත යුතුව ඇත.

03. එම ලිපියද සමඟ නව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉල්ලීමක් කල යුතු වේ. (එහිදීද නව බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේදී අනුගමනය කල යුතු සියලු ක්‍රියා පටිපාටි අනුගමනය කල යුතු වේ.)

ඉහත කුමන ආකාරයකින් හෝ නිකුත් කරන බලපත්‍රය සහ බැංකු පිටපත අදාල නිලධාරියාට පෞද්ගලිකව භාර නොදෙන අතර මුල්‍ය චක්‍රලේඛ 11/2013 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව එම බලපත්‍රය අමාත්‍යාංශ ලේකම්වයා වෙත එවීමට කටයුතු කරනු ලැබේ.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්/පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්:
01. මහා භාණ්ඩාගාර ලේකම්.
02. විගණකාධිපති.
03. අධ්‍යක්ෂ(අභ්‍යන්තර විගණන)
04. පරිගණක දත්ත ක්‍රියාකරු.